**ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය**

**කළමනාකරණ අධ්‍යයන පීඨය**

**ව්‍යවසායකත්වය සහ කුඩා ව්‍යාපාර කළමනාකරණ උසස් සහතිකපත්‍ර පාඨමාලාව**

**අවසාන පරීක්ෂණය - 2024**

**OSC2405: ව්‍යවසායකයින් සඳහා මෙහෙයුම් කළමනාකරණය**

**කාලය: පැය (02) දෙකයි**

***දිනය: 2024 අගෝස්තු 17*** ***වේලාව: පෙ.ව. 9.30 – පෙ.ව.11.30***

**උපදෙස්:**

- ප්‍රශ්න සියල්ලටම (04) පිළිතුරු සපයන්න. සියලුම ප්‍රශ්න වලට සමාන ලකුණු හිමි වේ.

**01 වන ප්‍රශ්නය**

නෙත්මි මේ වනවිට රෙදිපිළි කර්මාන්තයේ නියැළී සිටින ව්‍යවසායිකාවකි. ඇය සේවිකාවන් 5 දෙනෙකු සමඟ කුඩා ව්‍යාපාරයක් පවත්වාගෙන යන අතර ඇය තම ප්‍රදේශයේ තරුණ ගැහැණු ළමයින් සඳහා විවිධ වර්ගයේ ඇඳුම් නිර්මාණය කර බෙදා හරිනු ලබයි.

අ) මෙම ව්‍යාපාරයට අදාලව යෙදවුම් (Inputs) වර්ග පහක් (05) නම් කරන්න. (ලකුණු 05)

ආ) මෙම ව්‍යාපාරයට අදාලව නියැදි නිෂ්පාදන පද්ධතියක් (Sample production system) අඳින්න. (ලකුණු 10)

ඉ) නෙත්මිට තම ව්‍යාපාරය පාලනය කිරීමට අනුගමනය කළ හැකි පාලන ක්‍රියාකාරකම් (Controlling functions) හතරක් (04) හඳුනා ගන්න. සුදුසු උදාහරණ සහිතව ඒවා විස්තර කරන්න. (ලකුණු 10)

**(මුළු ලකුණු 25)**

**02 වන ප්‍රශ්නය**

තිළිණ වඩු කාර්මිකයෙක් වන අතර ඔහු නිවෙස්වලට සහ කාර්යාලවලට අවශ්‍ය විවිධ වර්ගයේ ගෘහභාණ්ඩ නිෂ්පාදනය කර අලෙවි කරයි.

අ) තිළිණගේ ව්‍යාපාරයේ පාරිභෝගිකයන් (Customers) වර්ග පහක් (05) හඳුනා ගන්න. (ලකුණු 10)

ආ) තිළිණ තම ව්‍යාපාරයේ ආරම්භය සම්බන්ධයෙන් සලකා බැලිය යුතු වැදගත් ඉල්ලුම් ප්‍රශ්න (Demand questions) හඳුනාගෙන විස්තර කරන්න. (ලකුණු 10)

ඉ) තිළිණගේ අලෙවිකරණ සැලැස්මට (Marketing plan) ඇතුළත් කළ යුතු කරුණු පහක් (05) හඳුනාගෙන කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

**(මුළු ලකුණු 25)**

**03 වන ප්‍රශ්නය**

ඇ) සංවිධානයේ සම්පත් ඵලදායී ලෙස භාවිතා කිරීම සහ සංවිධානයේ සුමට ක්‍රියාකාරීත්වය සඳහා නිෂ්පාදන සැලසුම් කිරීමේ (Production planning) වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 10)

ආ) ඔබ ටින් මාළු නිෂ්පාදනයට අදාල නව ව්‍යාපාරයක් ආරම්භ කරන බව සිතන්න. ඔබේ ව්‍යාපාරය සඳහා සුදුසු ස්ථානයක් (selecting a site) තෝරාගැනීමේදී ඔබ විසින් සලකා බැලිය යුතු සාධක විස්තර කරන්න. (ලකුණු 10)

ඉ) ආයතනයක් මෙවලම් සම්පාදනය කිරීමට (Tooling up) හේතු හඳුනා ගන්න. (ලකුණු 05)

**(මුළු ලකුණු 25)**

**04 වන ප්‍රශ්නය**

අ) සංවිධානයක් සඳහා හොඳ බිම් සැකැස්මක් (plant layout) තිබීමේ වැදගත්කම සුදුසු උදාහරණ සමඟ පැහැදිලි කරන්න. (ලකුණු 10)

ආ) ඉක්මනින් අලෙවිවන පාරිභෝගික භාණ්ඩ (Fast moving consumer goods) අලෙවිකරන ආයතනයකට තොග පාලනයේ වැදගත්කම සුදුසු උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 15)

**(මුළු ලකුණු 25)**

**-හිමිකම් ඇවිරිණි-**